ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.පා./ලි/001

2018 අප්‍රේල් 02 යොමු අංකය: 1718-036

දයාබර දෙමාපියන් වෙත,

<u>දහම් පාසලේ 17 වන සංවත්සර උත්සවය - සමරු කලාපය</u>

එක්සත් අරාබි එමීරයේ ශ්‍රී ලාංකේය දරු දැරියනට සහ ප්‍රජාවට මහඟු සේවයක් ඉටු කරන අපේ දහම් පාසල, 2018 අප්‍රේල් 20 වැනි දින 17 වන සංවත්සරය සමරන්නේ ඉමහත් ආඩම්බරයකිනි.

උත්සවය සැමරීම සඳහා නිකුත් කිරීමට නියමිත සමරු කලාපයේ පළකිරීම සඳහා අප දහම් පාසලේ දරු දැරියන්ගේ සහ දෙමාපියන්ගේ නිර්මාණ අවශ්‍ය වී ඇත. කරුණාකර ඔබගේ හෝ ඔබගේ දරුවාගේ නිර්මාණ අප්‍රේල් මස 09 වැනි දිනට පෙර දහම් පාසලේ සංවිධායක මණ්ඩලය වෙත email: dahampasaladubai@gmail.com මගින් ලැබෙන්නට සැලැස්වීමෙන් සහාය වන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.

දරුවන්ගේ නිර්මාණ දෙමාපියන්ගේ උපදෙස් මත ඔබ දරුවන් විසින්ම කල නිර්මාණ වියයුතු වන අතර ඒ බව දෙමාපියන් විසින් ලිපියකින් සහතික කලයුතුවේ. අපට ලැබෙන නිර්මාණ අතරින් විනිශ්චය මණ්ඩලයක් විසින් තෝරාගනු ලබන නිර්මාණ පමණක් සමරු කලාපයට ඇතුලත් කරන බව කරුණාවෙන් දැනුම් දෙමු.

පහත සඳහන් නිර්මාණ මෙම සමරු කලාපයේ පල කිරීම සඳහා ඉදිරිපත් කල හැක.

- කවි හෝ කතන්දර
- රචනා
- චිත්‍ර
- දෙමාපියන් හෝ දරුවන් විසින් ගන්නා ලද ඡායාරූප

ස්තුතියි!

සංවිධායක කමිටුව
ඩුබායි දහම් පාසල

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org